# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

## වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

### ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2010
### 2012 ජනවාරි

**BMGT 3025 -- කුඩා ව්‍යාපාර කළමනාකරණය**

කාලය : පැය 03 යි

ප්‍රශ්න සංඛ්‍යාව : 06.

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

01. (අ) "කුඩා ව්‍යාපාර හඳුනාගැනීමේ නිර්නායකයන් රටින් රටට වෙනස් වේ". මෙම ප්‍රකාශය නිර්වචන ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ආ) කුඩා කර්මාන්ත ගති ලක්ෂණ මහා පරිමාණ ආයතනවලින් වෙනස්වේ. එම ගතිලක්ෂණ සංසන්දනාත්මකව ඉදිරිපත් කරන්න.

(ලකුණු 06)

(ඇ) රටක ආර්ථික සංවර්ධනයට කුඩා ව්‍යාපාර ආයතන විශාල දායකත්වයක් ලබා දෙයි. දකුණු ආසියාතික රටවල් ඇසුරින් ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

02. (අ) "ව්‍යවසායකයෝ අවදානම් දරන්නෝ වෙති". මෙම ප්‍රකාශය නිර්වචන ඇසුරින් පහදන්න.

(ලකුණු 06)

(ආ) ව්‍යවසායකත්ව වර්ධන ක්‍රියාවලිය පහදන්න.

(ලකුණු 06)

(ඇ) "ව්‍යවසායකයන් සාමාන්‍ය පුද්ගලයන්ගෙන් සෑම විටම වෙන්කර හඳුනාගත හැක". ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟද? විස්තාරණය කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

03. (අ) ව්‍යවසායකත්වයේ ආකෘතීන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ආ) "ව්‍යවසායකත්වයේ ප්‍රතිලාභ බොහෝ ඇත" ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නෙහිද? සාකච්ඡා කරන්න.

(ලකුණු 07)

(ඇ) ව්‍යවසායකත්වය තුළ සිදු වියහැකි පසුබෑම් මොනවාද? විස්තර කරන්න.

(ලකුණු 07)

(මුළු ලකුණු 20)

04. ## අභයගේ ගැටළුව

අභය අවුරුදු 23 ක් පමණ වූ තරුණයෙකි. ඔහු උසස්පෙළෙන් පසු රැකියාවක් සොයමින් සිටී. ඔහු පදිංචි වී සිටින්නේ ත්‍රිකුණාමලය නගරයට ආසන්නවයි. නැගෙනහිර නවෝදය ව්‍යාපෘතිය යටතේ සීඝ්‍ර සංවර්ධනයක් ඔහුගේ ගම් ප්‍රදේශයේ ඇති වී ඇත. සංචාරක පුනරුදයක් ද ඔහු දකිමින් සිටී. ඔහුගේ අභිප්‍රාය වී ඇත්තේද කුඩා සංචාරක නිවාඩු නිකේතනයක් ඇරඹීමටයි.

ඔහුගේ බාල සහෝදරයා වන සේන කොළඹට මාළු ප්‍රවාහනය කරන පුද්ගලයෙකි. එයින් ඔහු හොඳ ආදායමක් උපයයි. සේන සෑම විටම අභයගෙන් ඉල්ලා සිටින්නේ නවීන පහසුකම් ඇති මාළු වෙළඳසැලක් ආරම්භ කරන ලෙසයි. නැතහොත් සේනගේ ව්‍යාපාරයට හවුල්වන ලෙසද ඔහු ඉල්ලා සිටී.

රාජ්‍ය නොවන සංවිධානයක් වන Fresh fish ආයතනය මුහුදු බෙල්ලන් ව්‍යාපෘතියකට මුදල් ආධාර සහ දැනුම ලබා දෙයි. මුහුදු බෙල්ලන් සඳහා අවට සංචාරක හෝටල් වලින්ද හොඳ ඉල්ලුමක් පවතී. අභය ඊටද රුචිකත්වයක් දක්වයි. නමුත් ඔහුගේ මනස නිරවුල් නැත. කුමකින් වඩා හොඳ ආදායමක් ලබාගත හැකිවේදැයි ඔහු සිතමින් සිටියි.

සුදුසුම ව්‍යාපාරය තෝරා ගැනීමට ව්‍යාපාර උපදෙස් ලබාදෙන විශේෂඥයකු වෙත යාමට අභය අදහස් කරයි. ඔබ එම විශේෂඥයායැයි සිතා අභයට උපදෙස් දෙන්න

(ලකුණු 20)

05. (අ) ව්‍යාපෘති වාර්තාවක් යනු කුමක්ද?

(ලකුණු 04)

(ආ) නව ව්‍යාපාරයක් සඳහා ව්‍යාපෘති වාර්තාවක ඇති වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 04)

(ඇ) යෝජිත කුඩා පරිමාණ ව්‍යාපාරයක් සඳහා සුදුසු උපකල්පන භාවිත කරමින් ව්‍යාපෘති වාර්තාවක් සකස් කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

06. (අ) කුඩා ව්‍යාපාරයන්හි අසමාර්ථයන් මොනවාද?

(ලකුණු 10)

(ආ) රටක් වශයෙන් ඉහත අසමාර්ථයන් සඳහා විසඳුම් මොනවාද?

(ලකුණු 10)

(මුළු ලකුණු 20)